# රිය අනතුරු ක්‍රියා පිළිවෙත

ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් වාහන, යුධ හමුදාව වෙත සිවිල් දෙපාර්තමේන්තු සහ සිවිල් පුද්ගලයිනගෙන් පවරාගෙන හමුදාගත කල වාහන යුධ හමුදාවේ රාජකාරි කරන විට යම් අනතුරකට භාජනය වුවහොත් හචනි 11/76 නියෝගයට අනුව රිය අනතුරු ක්‍රියා පිළිවෙත අනුගමනය කල යුතුවේ. කුලී ගෙවීමේ පදනම මත යුධ හමුදා රාජකාරි සඳහා පවරාගන්නා ලද වාහන වෙනුවෙන් රිය අනතුරු පිළිවෙත අනුගමනය නොකෙරේ. රිය අනතුරකදී හචනි 27/99 උපදෙස් අනුව රිය අනතුරු පිළිවෙත අනුගමනය නොකිරීමට නම් ඒ සඳහා පූර්ණ අනුමැතිය උමාජේශා/නීතිසේවාඅම වෙතින් ලබාගත යුතු වේ. රිය අනතුරක් සිදුවූ විට එක් එක් ආයතන වෙතින් අනුගමනය කල යුතු ක්‍රියා පිළිවෙත් පහත සඳහන් පරිදි වේ.

1. **<u>ඒකකය වෙතින් ගත යුතු ක්‍රියාමාර්ග:</u>**

අ. රිය අනතුරක් සිදුවූ වහාම ඒ බැව් ශ්‍රීලයුපොහේබ වෙත රපෝර්තු කල යුතුයි. එසේම මාර්ගයේ සිදුවන කිනම් හෝ අනතුරක් සිවිල් පුද්ගලයින් සිවිල් වාහන දේපල සම්බන්ධ අනතුරක් සිදුවුවද/නොවූවද සිවිල් පොලිසිය වෙත දැන්විය යුතුය.

ආ. සෑම රිය අනතුරක්ම සිදුවී පැය 24 ක් ඇතුලත ඒකකය විසින් අනතුර හා සම්බන්ධ පහත සඳහන් විස්තර ඇතුලත් කොට තම ඒකකයේ උසස් මූලස්ථාන අයත් ශ්‍රීලයුපොහේබ සහ ශ්‍රීලවියාඉ වැඩපල වෙත පිටපත් සහිතව සංඥාවක් උමාජේශා/ නීතිසේවාඅම/සැප්‍රඅම/වියාඉඅම/විනයාරක්‍ෂකඅම වෙත දැන්විය යුතුයි. අණුබණ්ඩයක වාහනයක් නම් ඒකකය වෙත දැන්විය යුතු අතර, ඒකකය මගින් ඒ සම්බන්ධයෙන් ඉහත සඳහන් ක්‍රියා මාර්ග ගනු ලැබේ.

(1) රිය අනතුර සිදුවූ දිනය හා වේලාව.
(2) රිය අනතුර සිදුවූ ස්ථානය.
(3) රිය අනතුරේ ස්වභාවය.
(4) ගමනාධිපතිගේ නම.
(5) යුහ රියදුරුගේ නම/සිවිල් රියදුරුගේ නම සහ ලිපිනය.
(6) සිදුවූ අලාභහානිය දළ වශයෙන්

ඇ. රිය අනතුරක් සිදුවී දින 07 ක් ඇතුලත පහත සඳහන් ලියකියවිලි නීතිසේවාඅම වෙත ඉදිරිපත් කල යුතුවේ.

(1) සම්පූර්ණ කරන ලද යුආප්‍ර 16 (හදිසි රිය අනතුරු වාර්ථාව) පිටපත් 01, රියදුරුගේ ප්‍රකාශණ පිටපත් 01, සාක්‍ෂිකරුවන්ගේ ප්‍රකාශණ පිටපත් 01 බැගින්

(2) රිය අනතුර සම්බන්ධ මිල දර්ශණ වාර්ථාවක් ඉදිරිපත් කිරීම සඳහා වියාඉඅම වෙත ඉදිරිපත් කරන ලද යුආපොදු 07 හි පිටපත් 01 ක්, රිය අනතුර සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාව (මුරෙ 104 (3))

ඈ. ඒකකය විසින් ශ්‍රීලවියාඉ වෙතින් රිය අනතුරු අලාභහානි වාර්තාවක් ලබා ගැනීම පිණිස යුආපොදු 07 නගා එහි ඉහල කොටසෙහි රිය අනතුරු යනුවෙන් රතු තීන්තෙන් සඳහන් කර නීතිසේවාඅම වෙත පිටපත් සහිතව වියාඉඅම වෙත ඉදිරිපත් කල යුතුය.

2. **<u>නීතිසේවාඅම වෙතින් ගතයුතු ක්‍රියාමාර්ග:</u>**

යුආප්‍ර 16 මුල් පිටපත හා අනෙකුත් ලියකියවිලි ඒකක වෙතින් ලද පසු මුරෙ 104 (3) ට අනුකූලව නැතිවීම්/අලාභහානිවීම් සම්බන්ධව මූලික රපෝර්තුව විගණකාධිපති/උමාජේශා සහ ඒකකයට පිටපත් සහිතව රාජ්‍ය ආරක්‍ෂක ලේකම් වෙත ඉදිරිපත් කල යුතුයි.

3. **ශ්‍රීලයුපොහේබ වෙතින් ගත යුතු ක්‍රියාමාර්ගඃ**

රිය අනතුරු සිදුවී සති 02 ක් ඇතුලත යුධ හමුදා පොලිස් වාර්ථාවකින් නීතිසේවාඅම සහ ඒකකයට ඉදිරිපත් කල යුතුයි.

4. **ශ්‍රීලවියාඉ විසින් ගත යුතු ක්‍රියාමාර්ගඃ**

අ. රිය අනතුර පිළිබඳ සංඥා පණිවිඩය ලැබීමෙන් පසු සිදුවී ඇති අලාභහානි තක්සේරු කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කල යුතුයි. මණ්ඩලය විසින් සංඥා පණිවිඩය ලැබී දින 07 ක් ඇතුලත අදාල අලාභහානිය සැබැඳිව තක්සේරු වාර්ථාව ඉදිරිපත් කල යුතුයි.

ආ. තක්සේරු වාර්ථාව ලැබීමෙන් පසුව මිල දර්ශණ ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍රයේ (යුආපොදු 33 අ) දකුණු පස ඉහල කෙලවරේ හදිසි රිය අනතුරු යනුවෙන් රතු තීන්තෙන් ලියා ශ්‍රීලවියාඉ විසින් ශ්‍රීලයුයුබ වෙත ඉදිරිපත් කල යුතුයි. එම මිල දර්ශණය ශ්‍රීලයුයුබ වෙතින් ශ්‍රීලවියාඉ වෙත ලද පසු ශ්‍රීලවියාඉ විසින් ඒකකය වෙත ඉදිරිපත් කල යුතුයි.

5. **ශ්‍රීලයුයුබ වෙතින් ගත යුතු ක්‍රියාමාර්ගඃ**

මිල දර්ශණ ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍රය ශ්‍රීලවියාඉ වෙතින් ලද පසු ශ්‍රීලයුයුබ විසින් වැඩ කරන දින 05 ක් ඇතුලත අදාල මිල දර්ශණ ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍රය නිසි අයුරු සම්පූර්ණ කර ශ්‍රීලවියාඉ වෙත ඉදිරිපත් කල යුතුයි. අදාල මිල දර්ශණය ශ්‍රීලවියාඉ වෙත ලද පසු වහාම අදාල ඒකකය වෙත ඉදිරිපත් කල යුතුයි. මෙහිදී යම්කිසි භාණ්ඩයක වටිනාකම ලබා ගැනීමට අපහසු අවස්ථාවලදී එම භාණ්ඩයට සමාන භාණ්ඩයකට සාධාරණ මිලක් අණදෙන නිළධාරි ශ්‍රීලයුයුබ හට නිගමනය කල හැක.

6. **රිය අනතුරු සම්බන්ධයෙන් මුපළ පත්කිරීමඃ**

යම්කිසි අනතුරක් පිළිබඳව ඒකකය විසින් මුපළ පත්කල යුතුවේ. මුපළ රෙගුලාසි මාලාවේ සඳහන් වී ඇති පරිදි අණදෙන නිළධාරිට අමතරව වෙනත් නිළධාරියෙකු හට මුපළ කැඳවිය හැක. එසේ වුවද එවැනි අවස්ථාවක මුපළ හි සම්බන්ධීකරණයේ වගකීම ඒකක අණදෙන නිළධාරි සතු වේ. පරීක්ෂණ උසාවිය ප්‍රමාදව රැස්වී එම රිය අනතුරට අදාල සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සහ එහි සත්‍යාසත්‍යභාවයන් ඔවුන්ගේ මතකය ප්‍රකෘතිමත්ව පවත්වා අවදියේ සටහන් කරගත යුතුය.

ශ්‍රීලවියාඉ වෙතින් අලාභහානි තක්සේරු වාර්තාව ලැබීමෙන් පසුව මුපළ සහ අණදෙන නිළධාරි අලාභහානි වී ඇති මුදල පිළිබඳව අදාල අයවලුන් වෙත දන්වාලීමේදී අලුත්වැඩියා කිරීමට වැයවනු ලබන මුදල සියයට (%) අනුපාත ගණනින් නොව නියම වටිනාකම මුදලින්ම ප්‍රකාශ කල යුතුවේ.

අණදෙන නිළධාරි තම නිගමනය ඇතුලත් කිරීමේදී පහත සඳහන් කරුණු ගැනද සලකා බැලිය යුතුය.

අ. රජයට සිදුවී ඇති අලාභය සම්පූර්ණ වශයෙන් එනම්, එම භාණ්ඩය නැවත තැන්පත් කිරීමට වැයවන මුදල සලකා බැලිය යුතුවේ.

ආ. නි/සෙසුනිළයෙකු විසින් සිදුකර ඇති නැතිවීම්/අලාභහානිවීම් අරබයා ඔහු කොතෙක් දුරට වගකිව යුතුද යන්න සොයා බැලිය යුතු අතර, මෙහිදී සහන සැලසීමේ අවස්ථාවන් විස්තර සහිතව සඳහන් කල යුතුය.

ඇ. අදාල නි/සෙසුනිළයා හට ආර්ථික අපහසුකම් ඇති නොවන පරිදි කොතෙක් දුරට සම්පූර්ණ මුදලම ආපසු ලබාගත හැකිද යන වග.

අණදෙන නිළධාරි නිගමනය ඇතුලත් කිරීමෙන් පසු මුපළ වාර්ථා පිටපත් 04 ක් රිය අනතුර සිදුවූ දින සිට මසක් ඇතුලත ඒකකය අයත් උසස් මූලස්ථාන මගින් නීතිසේවාඅම වෙත ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය. මුපළ වාර්ථා ඉදිරිපත් කිරීමට යම්කිසි ප්‍රමාදයක් සිදුවන්නේ නම් ඒකක අණදෙන නිළධාරි විසින් රිය අනතුර සිදුවූ දින සිට මාසයක් සම්පූර්ණ වීමේදී හා ඉන්පසු සතිපතා එසේ ප්‍රමාදවීමට හේතුව උසස් මූලස්ථාන වෙතින් ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය.

## අවසන් ක්‍රියාමාර්ග

ඒකකයේ සහ අදාල උසස් මූලස්ථානයේ මුපළ වාර්තා නීතිසේවාඅම වෙත ලද පසු ඔවුන් විසින් එම වාර්තා යුද හමුදාපතිගේ නිගමනය සඳහා ඉදිරිපත් කල යුතුවේ. යුධ හමුදාපතිගේ නිගමනය නීතිසේවාඅම වෙත ලද පසු අදාල මුපළ වාර්තාව උසස් මූලස්ථාන හරහා ඒකකය වෙත ඉදිරිපත් කිරීමට නීතිසේවාඅම වෙතින් ක්‍රියාකරනු ලැබේ.

යුද හමුදාපතිගේ නිගමනය සහිත වූ මුපළ වාර්තා ඒකකය වෙත ලද පසු සතියක් ඇතුලත මුරෙ 104 (4) අවසන් වාර්තාව සමග පිටපත් 05 කින් යුතුව උසස් මූලස්ථානය මගින් නීතිසේවාඅම වෙත ලද පසු යුධ හමුදාපතිගේ නිර්දේශයන්ද සමග එම වාර්තාව විගණකාධිපතිට පිටපත් සහිතව රාජ්‍ය ආරක්ෂක ලේකම් වෙත යැවිය යුතුය. රාජ්‍ය ආරක්ෂක ලේකම්ගේ නිගමනය නීතිසේවාඅම වෙත ලද පසු ඒ සම්බන්ධව උමාජේ ශාඛාව වෙත හා ඒකකය වෙත දැන්විය යුතුවේ.

අදාල මුපළ වාර්තා ඒකකය වෙත ලද පසු ඒකකය විසින් යුආප්‍ර 16 දෙවන පිටපතේ ම සහ බ කොටස් සම්පූර්ණ කර උසස් මූලස්ථාන වෙතින් පාලනමය කටයුතු සඳහා සහ ආපසු එවීම පිණිස නැවත නීතිසේවාඅම වෙත ඉදිරිපත් කල යුතුය. නීතිසේවාඅම වෙතින් පාලන කටයුතු නිමවෙන් පසු යුආප්‍ර 16 හි දෙවන පිටපත ඒකකය වෙත එවනු ලබන අතර, එම අවස්ථාව වන විට අදාල රිය අනතුර සම්බන්ධයෙන් සියලු පාලන කටයුතු අවසන් වී ඇති අතර, එම ලිපිගොනුව පාලන කටයුතු වලින් ඉවත් කර වසා තැබීමට ක්‍රියාකල යුතුයි. යුආප්‍ර 16 දෙවන පිටපත නීතිසේවාඅම වෙතින් ඒකකය වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී රිය අනතුරට සම්බන්ධ අයවලුන් වෙතින් යම්කිසි මුදලක් අයකර ගැනීමට ඇත්නම් ඒ බව උමාජේ ශාඛාව වෙත හා වැහාලේඅම වෙත දැන්වීමට කටයුතු කරනු ලැබේ.

## සිවිල උසාවි නිගමනයඃ

සිවිල් උසාවියක් මගින් යුධ හමුදා රියදුරුට විරුද්ධව චෝදනා එල්ල කරන අවස්ථාවක ඒකකය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතුයි.

අ. 1950 යුධ හමුදා විනය රෙගුලාසි මාලාවට අනුව යුධ හමුදා රියදුරු උසාවිය වෙත ඉදිරිපත් කිරීම සඳහා නිළධාරියෙකු නම් කල යුතුයි.

ආ. මෙම සිවිල් උසාවි නඩුව අවසානයේදී නඩු අංකය, එහි තීන්දුව හා යම් දඩයක් නියමකර ඇත්නම් ඒ විස්තර සහ ඊට අදාල වෙනත් කරුණු ඇත්නම් ඒ බව ශ්‍රීලයුපොහේබට පිටපත් සහිතව උමාජේශා වෙත දැනුම් දිය යුතුයි.

යුධ හමුදාවට අයත් නොවන වෙනත් වාහනයක රියදුරු හට සිවිල් උසාවියක චෝදනා නගා ඇත්නම් ශ්‍රීලයුපොහේබ වෙතින් අදාල නඩු අංකය හා උසාවි නිගමනයට හෝ අනෙකුත් විස්තරද රිය අනතුර පිළිබඳ සිවිල් පොලිසිය ක්‍රියා කරන්නේ නම් ඊට හේතුවද සිවිල් පොලිසිය වෙතින් ලබාගෙන එම විස්තර ඒකකය වෙත හා උමාජේ ශාඛාවට පිටපත් සහිතව නීතිසේවාඅම වෙත දැන්වීමට ක්‍රියාකල යුතුවේ.

<u>විෂයභාර ලිපිකරුට උපදෙස්:</u>

රිය අනතුරෙහි මුපළ සම්බන්ධයෙන් ක්‍රියාකරන විෂයභාර ලිපිකරුවන් රිය අනතුර සිදුවී අලාභහානි අයකර ගැනීමේදී ඇතිවන ගැටළු සහගත තත්වයන් මගහරවා ගෙන ක්‍රියා කිරීමට ගත යුතු ක්‍රියාමාර්ගයන් පහත සඳහන් වන අතර, විශේෂයෙන් යුහ වාහනය සිවිල් වාහනයක ගැටී ඇති අවස්ථාවකදී එම රිය අනතුර දැනුම්දුන් වහාම මෙම ක්‍රියාමාර්ගයන් ගත යුතු වේ.

අ. සිවිල් පොලිසියට පැමිණිලි කල පැමිණිල්ලේ පිටපතක් ලබාගත යුතුයි.

ආ. අනතුරට සම්බන්ධ සිවිල් වාහනය රක්‍ෂණය ආවරණයක් ලබා ඇති රක්‍ෂණ ආයතනයේ නම සහ රක්‍ෂණ ඔප්පු අංකයද අනතුරින් යුහ වාහනයට සිදුවූ අලාභහානි එම ඔප්පු අංකය යටතේ අදාල රක්‍ෂණ ආයතනයේ පරීක්‍ෂණයට ලක්කරන ලෙස හා එසේ පරීක්‍ෂා නොකර යුහ වාහනය අලුත්වැඩියා නොකරන ලෙසට අදාල අයවලුන් වෙත දැන්විය යුතුයි. මෙසේ යුහ වාහනයක් රක්‍ෂණ ආයතනයේ පරීක්‍ෂාවට ලක් නොකර යම්කිසි ක්‍රමයකින් අලුත්වැඩියා කලහොත්, එසේ අලුත්වැඩියා කිරීමට අණදුන් අයගෙන් යුහ රථයේ අලුත්වැඩියාව සඳහා ගිය වියදම අයකර ගැනීමට සිදුවන බව දැනුම් දිය යුතුයි.

ඇ. යුහ වාහනය රක්‍ෂණ ආයතනයේ පරීක්‍ෂාවට ලක් කිරීමෙන් අනතුරුව පමණක් ව්‍යාඉ ක්‍රියා පිළිවෙත අනුව අලුත්වැඩියා කිරීම සඳහා නීතිසේවාඅම වෙතින් අනුමැතිය ලබාගත යුතුයි.

ඈ. මෙවන් අනතුරකදී එහි අලාභය රු:25000.00 අඩු නම් නීතිසේවාඅම වෙතින් අනුමැතිය ලබාගෙන මුපළ වකින් තොරව අලුත්වැඩියා කිරීමට හැකියාව ඇති අතර, රු:25000.00 ක වැඩි වටිනාකමකින් යුත් අනතුරකින් සිදුවන හානිය කුමන ආකාරයට අලුත්වැඩියා කලද ඒ සඳහා අනිවාර්‍යයෙන්ම මුපළ ක්‍රියා පිළිවෙත අනුගමනය කල යුතුයි.

ඉ. අනතුර කාර්මික දෝෂයක් මත සිදුවී ඇති අවස්ථාවක නම් එම වාහනය මෝටර් රථ පරීක්‍ෂක වෙත භාජනය කර ඔහුගේ වාර්ථාව ලබාගත යුතු වේ. එසේ ලබාගැනීමට නොහැකි අවස්ථාවක ශ්‍රීලව්‍යාඉ වැඩපලක් වෙත ඉදිරිපත් කර වාර්තාවක් ලබාගත යුතු අතර, එසේ ලබාගත් වාර්තාව මුපළ වාර්තාව සමග ඉදිරිපත් කල යුතු වේ.

ඊ. අනතුරකට අදාල මුපළ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව මුපළ වාර්තාවේ යුහපතිගේ නිගමනය අනුව අයකර ගැනීමට ඇත්නම් එම අයකර ගැනීම් අවසන් වනතුරු අනතුරට වගකිව යුතු අයවලුන් අස්කිරීමට, විශ්‍රාම ගැනීමට, වැරඅනි යැවීමට කටයුතු නොකල යුතුය.

උ. යුහ රථයට සිදුවූ අලාභහානි මාස 06 ඇතුලතදී ගෙවීමට අදාල රක්‍ෂණ ආයතනය වෙතින් ලබාගැනීමට ක්‍රියාකල යුතු අතර, එසේ ගෙවීමට එම රක්‍ෂණ ආයතනය භාර නොගන්නේ නම් එම අනතුර සම්බන්ධ නීති මගින් කටයුතු කර අලාභය අයකර ගැනීමට ගරු නීතිපති විසින් උපදෙස් ලබාගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් ක්‍රියාකල යුතුවේ.

ඌ. යුහ රථයේ අලාභහානි වටිනාකම රක්‍ෂණ ආයතනය ලබාදීමට භාරගන්නේ නම් ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි ගෙන්වා ගැනීමට කටයුතු කල යුතුවේ.

(1) යුහ රියදුරුගේ රියදුරු බලපත්‍රයේ ඡායාස්ථ පිටපතක්.

(2) යුහ වාහනය මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ එසේ නොමැතිනම් වාහනය යුධ හමුදාවට අයත් බවට සැප්‍රඅම වෙතින් සහතිකයක් ලබාගත යුතුයි.

(3) යුහ වාහනයේ අලුත්වැඩියා කටයුතු වියාඉඅම යටතේ සිදුකර ඇත්නම් එහි අවසන් බිල්පත් යුහ ලිපි ශීර්ෂයක යතුරුලියනය කර ගෙන්වා ගත යුතුයි.

(4) යුහ වාහනය සිවිල් ගරාජයකින් අලුත්වැඩියා කල අවස්ථාවකදී අදාල බිල්පත් එම ගරාජයෙන් ලබාගෙන තබා ගත යුතුයි.

(5) යුහ වාහනය සිවිල්/යුහ රියදුරුගේ වියදමින් අලුත්වැඩියා කරන්නේ නම් ඒ සඳහා අනුමැතිය සැප්‍රඅම වෙතින් ලබාගත යුතු බවත්, එසේ අනුමැතිය ලබාගෙන අලුත්වැඩියාවෙන් පසු වියාඉඅම වෙත ඉදිරිපත් කර අලුත්වැඩියාව සාර්ථක ලෙස කර ඇති බවට සහතිකයක් අනිවාර්යයෙන්ම සැප්‍රඅම වෙත ඉදිරිපත් කල යුතුයි.

(6) යම් අයුරකින් යුහ රියදුරු සහ සිවිල් රියදුරු සමග සමථයකට පැමිණියේ නම් යුහ වාහනය සැබැඳි සියලු වගකීම් යුහ රියදුරු විසින් දැරිය යුතුයි.

**<u>වකඅම/සැප්‍රඅම වෙතින් ගත යුතු ක්‍රියාමාර්ගයඃ</u>**

වකඅම/සැප්‍රඅම වෙතින් තමන් වෙත ලැබෙන ඉහත සඳහන් වාර්තා සම්බන්ධව යුහපතිගේ නිර්දේශයන් ලබාගෙන කපාහැරීම් අනුමැතිය සඳහා වු අයදුම්පත්‍රය සමග ඊට අදාල වාර්තා රාජ්‍ය ආරක්‍ෂක ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබේ. විනාශයට ලක්වූ එම දේපල කපාහැරීම සඳහා රඃආඃලේඃ වෙතින් වකඅම/සැප්‍රඅම වෙත අනුමැතිය අදාල උසස් මූලස්ථාන හරහා නියමිත ඒකක වෙත යවනු ලබයි. එම අනුමැතිය උපයෝගි කරගෙන ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් විනාශයට පත්වන රජයේ දේපල ඒකක දේපල වලින් කපා හැරීමටත් ආපසු තොගයට ගැනීමත් කල යුතුවේ.